**මතුගම ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 29 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයට අයත් ඉඩම් වෙන්දේසි කිරීමේදී සභාව සතු වූ පර්චස් 98.84 ක් වූ රු.3,276,800 ක් වටිනා ඉඩම් කොටස් 02 ක් ඉඩම් ගොඩනැගිලි ලේඛනයේ සටහන් කර තිබූ නමුත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් ගොඩනැගිලි වටිනාකම රු.3,276,800 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ආධාර මුදල රු.8,546,998 ක් වූ අතර ආදායම් හා වියදම් ගිණුමෙහි රු.13,389,346 ක් ලෙස දැක්වීම හේතුවෙන් කර්මාන්ත ආධාර වටිනාකම රු.4,842,348 ක් වැඩියෙන් ගිණුම්වල පෙන්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව කර්මාන්ත වියදම රු.8,546,998 ක් වුවත් ආදායම් හා වියදම් ගිණුමෙහි රු.29,056,134 ක් ලෙස දක්වා තිබීමෙන් කර්මාන්ත වියදම රු.20,509,136 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2014 විගණන වාර්තාවේ 2.2.1 (ඇ) ඡේදයෙන් දක්වා ඇති නිවැරදි කිරීම සඳහා අවිනිශ්චිත ගිණුම රු.3,482,240 ක් හර කොට එම ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල බැර කළ යුතු වුවත්, රු.4,439,581 ක මුදලක් අවිනිශ්චිත ගිණුම හා සමුච්චිත අරමුදල පිළිවෙලින් හර හා බැර කිරීම හේතුවෙන් අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හා සමුච්චිත අරමුදලේ බැර ශේෂය රු.957,341 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට ගෙවිය යුතු මුදල රු.6,976,357 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.6,920,036 ක් ලෙස දැක්වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්ට ගෙවිය යුතු මුදල රු.56,321 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය රු.232,526,246 ක් වූ අතර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.232,538,836 ක් වීම නිසා එම ගිණුම් අතර රු.12,590 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂයේ 6 වැඩසටහනට අදාලව රු.2,870,610 ක් වූ ප්‍රාග්ධන වියදම්, විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික යටතේ පුනරාවර්තන වියදමක් වශයෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.6,240,149 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු උපකරණ හා පුස්තකාල පොත් ප්‍රාග්ධන වියදම් යටතේ නොදක්වා පුනරාවර්තන වැය යටතේ දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුළදී ඉදිරි වර්ෂය සඳහා ලැබූ රු.61,460 ක මුදල කලින් ලද ආදායම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඒ) බැකෝ යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව දරන ලද නමුත් මෙතෙක් ගෙවා ඇති රු.50,150 ක වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් ආදායම් හා වියදම් ගිණුමට හර කර ණයහිමියන් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඔ) හිඟ හිටි මුද්දර ගාස්තු ආරම්භක ශේෂයක් නොමැති බැවින්, ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු.27,663,773 ක මුද්දර ගාස්තු ආදායම සමුච්චිත අරමුදල් ගිණුමට බැර කළ යුතු වුවත්, හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුමට බැර කර තිබුණි.

සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම වශයෙන් රු.37,500,000 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇස්තමේන්තු කර දක්වා තිබුණද ලැබිය යුතු මුද්දර ගාස්තු වශයෙන් දක්වා තිබුණේ රු.5,961,365 ක් පමණි. ඒ අනුව ලැබිය යුතු මුද්දර ගාස්තු මුදල රු.31,538,635 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා ශේෂය රු.498,453 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.308,675 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් පොදු ගබඩා ශේෂය රු.189,778 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ශේෂය රු.14,671,547 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.12,459,319 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සේවක ණය ශේෂය රු.2,212,228 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 5 කට අදාලව ගිණුම් අනුව ශේෂය රු.232,092,923 ක් වූ අතර ඒවාට අදාල උපලේඛන අනුව ශේෂය රු. 205,980,054 ක් වූයෙන් රු. 26,112,869 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

විස්තරාත්මක උපලේඛන හා තැන්පතු සහතික ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.13,306,920 ක් වූ ගිණුම් ශේෂ 3 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.4** **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දිගු කාලයක සිට හිඟ ශේෂ ලෙස ගිණුම්වල ඉදිරියට එමින් පැවති වීථි ආලෝක ආධාර රු.358,225 ක්ද, පෞද්ගලික බස් නැවතුම්පල ආදායම් රු.96,000 ක්ද අයකරගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් පැවත එන පලාත් පාලන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.6,920,036 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.14,075,479 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.11,549,979 ක් විය.

2.2 **<u>ආදායම් පරිපාලනය</u>**

2.2.1 **<u>හිඟ ආදායම්</u>**

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.12,983,647 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

2.2.2 **<u>වරිපනම් බදු</u>**

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.4,352,531 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට ඉන් රු.1,543,250 ක් හෙවත් සියයට 36 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය වූ රු.7,885,300 න් රු.3,497,543 ක් හෙවත් සියයට 44.3 ක ප්‍රමාණයක් අයකර තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.5,931,007 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ වරිපනම් බදු අයකිරීමේ ප්‍රගතිය සියයට 51.4 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු ගෙවන්නන්ගෙන් රු.10,000 කට වඩා හිඟ ශේෂයක් පෙන්නුම් කරන වරිපනම් බදුකරුවන් 42 ක් විය. ඔවුන්ගෙන් අය විය යුතු ශේෂය රු.795,822 ක් අයකරගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.3 <u>අක්කර බදු</u>

ප්‍රවර්තන වර්ෂයේදී අක්කර බදු වශයෙන් රු.42,834 ක් බිල් කර තිබුණද ඉන් අයකර තිබුණේ රු.40,106 ක් පමණි. එසේම වර්ෂය ආරම්භයට රු.94,486 ක් වූ හිඟ ශේෂයෙන් රු.76,864 ක් පමණක් අයකර ගැනීම නිසා ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ථ අක්කර බදු හිඟ ශේෂය රු.20,350 ක් විය.

2.2.4 <u>ව්‍යාපාර බදු</u>

(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කළ ව්‍යාපාර බදු ආදායම රු.1,979,008 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට ඉන් රු.214,041 ක් හෙවත් සියයට 11 ක ප්‍රතිශතයක් අයකරගෙන නොතිබුණි.

(ආ) වර්ෂය ආරම්භයේ හිඟ ශේෂය රු.151,750 ක් වූ අතර එම හිඟ ශේෂයෙන් රු.53,660 ක් අයකරගෙන නොතිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟය රු.267,700 ක් විය.

2.2.5 <u>වෙළඳ ස්ථාන කුලී</u>

(අ) සමාලෝචිත වර්ෂයේ වෙළඳ ස්ථාන කුලී සඳහා බිල් කළ ආදායම රු.2,791,119 ක් වූ අතර ඉන් රු.2,260,503 ක් අයකර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට සමස්ථ වෙළඳ ස්ථාන කුලී හිඟය රු.516,623 ක් විය.

(ආ) සභා බල ප්‍රදේශයේ මුද්‍රා තබා ඇති හා කඩා ඉවත් කරන ලද කඩකාමර 12 කින් රු.241,426 ක කඩ කුලී ශේෂයක් අය විය යුතු අතර 2015 දෙසැම්බර් 31 දින වන විට මාස 05 සිට මාස 38 දක්වා එම ශේෂ හිඟව පැවතුණි.

2.2.6 <u>නාමපුවරු හා ප්‍රචාරක දැන්වීම් ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුළ සවි කර ඇති නාම පුවරු/ ප්‍රචාරක දැන්වීම්වලින් රු.872,600 ක ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.7 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 24,461,365 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 18,500,000 |
| මුද්දර ගාස්තු | 5,961,365 |

2.2.8 <u>ඉඩම් විකුණුම් බදු</u>

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් සියයට එකක ආදායමක් සභාව විසින් ලබා ගත යුතු වුවත් එසේ සිදු නොකර සභාවේ ආදායම් පරිපාලක විසින් සකස් කර තිබූ දල ඇස්තමේන්තුවෙන් සියයට එකක මුදල ලබා ගෙන තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයට අයත් බෝන්දුපිටිය අලවතුගොඩ එස්ටේට් (නිව් සිටි) ඉඩම වෙන්දේසි කිරීමේදී අය කර ඇති සියයට 1 ක බදු මුදල රු.330,696 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2010 වර්ෂයේදී කුට්ටිගල් නිෂ්පාදනය සඳහා රු.130,862 කට මිලදී ගත් යන්ත්‍රය මගින් නියමිත ප්‍රමිතියට අනුව ගල් නිෂ්පාදනය කිරීමට නොහැකි වීම මත, 2014 වර්ෂයේදී රු.31,060 ක මිලකට එය විකුණා තිබූ අතර එමගින් සභාවට රු.99,802 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) බැකෝ යන්ත්‍රය හා ටිපර් රථය සභාවේ කටයුතු සඳහා හා බාහිර කටයුතු සඳහා යොදවා ගෙන තිබූ අතර ඒ සඳහා ඉටු කරන ලද කාර්යයන් දැක්වෙන ලේඛනයේ හා සේවයේ යෙදවීම පිළිබඳව ධාවන සටහන් එකිනෙකට නොසැසඳී තිබුණි. මෙම යන්ත්‍ර සේවයේ යෙදවීම සහ ඒවායේ අධීක්ෂණය නිසියාකාරව සිදු වී නොතිබුණි.

### 3.2 පොදු පහසුකම් සඳහා වෙන් කළ ඉඩම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(I) 2008 වර්ෂයේදී මැණික්ගොඩ කුරුඳුවත්ත ඉඩමෙහි පොදු පහසුකම් සඳහා පර්චස් 118.65 ක ප්‍රමාණයක් කොටස් 2 කින් සභාව පවරා ගෙන තිබූ අතර එම බිම් කොටස් දෙකෙන් පර්චස් 31 ක් වූ ඉඩම් කොටස පොදු පහසුකම් සඳහා නුසුදුසු ජලය පිරුණු ස්ථානයක් බව නිරීක්ෂණය විය. පර්චස් 87.65 ක් වූ අනෙක් බිම් කොටසද ඉඩමේ එක් අන්තයක පිහිටි අතර එය කුඹුරකට හා ඇලකට යාබදව පිහිටා තිබුණි.

(II) උක්ත ඉඩම 2008 වර්ෂයේදී අනුබෙදුම් අනුමත කර සභාවට පොදු කොටස පවරා දී තිබුණද සභාව එම පවරා දුන් ඉඩම් කොටස් සඳහා ඒවා මැණුම් කර සීමා වෙන්වෙන සේ වැට ගසා සභාවේ පොදු කොටස වශයෙන් නාමපුවරු හෝ සවි කර නොතිබුණි. එම ඉඩම් අනවසරයෙන් අල්ලාගැනීම නිසා නැවතත් එම බිම් කට්ටි මැණුම් කර 2015 සැප්තැම්බර් 22 දින රු.56,700 ක් මැණුම් ගාස්තු වශයෙන් ගෙවීමට සිදුවී තිබුණි.

(III) සභාවට අයත් පොදු ඉඩම් කොටස් 08 කට අදාලව ක්‍රීඩා පිටි, පොදු ළිං, සුසාන භූමි යනාදියේ භූමි ප්‍රමාණ වෙන් කර වැට ගසා සභාවට අයත් ඉඩම් කොටස වශයෙන් හඳුනාගත හැකි ලෙස වෙන් කර නොගැනීම නිසා 2015 වර්ෂයේදී එම ඉඩම් නැවත මැණුම් කිරීම සඳහා රු.270,974 ක් සභා අරමුදලින් වැය කර තිබුණි.

(IV) පහත විස්තර කෙරෙන ඉඩම් සභාවට පොදු පහසුකම් කටයුතු සඳහා වෙන් කර ඇතත්, බාහිර පුද්ගලයින් විසින් අනවසරයෙන් ඉඩමෙන් කොටසක් අල්ලාගෙන තිබුණි.

| ඉඩමේ නම | පිහිටීම | ඉඩමේ ප්‍රමාණය | විස්තරය |
| --- | --- | --- | --- |
| බෝදරගම පාර්ක් | යටදොල පිහිටි බෝදරගම පාර්ක් | රූඩ් 02, පර්.5.30 | පොදු පහසුකම් සඳහා වෙන් කර තිබූ ඉඩම අසල පිහිටි ලොට් 79 පදිංචිකරු විසින් අනවසරයෙන් පර්.06.36 ක් අල්ලාගෙන තිබුණි. අස්කිරීම් නිවේදන යවා තිබුණි. |
| වැල්කන්දල කැටේලන්ද | වැල්කන්දල | අක්. 02, පර්. 33 | මෙම ඉඩම අසල පදිංචිකරුවන් විසින් අනවසරයෙන් වගා කටයුතු සිදු කර තිබුණි. |

## 3.3 කොන්ත්‍රාත් පාලනය

(අ) 2006 ජනවාරි 26 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛ අංක 08 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ඡේදය ප්‍රකාරව කිසියම් නිශ්චිත කාලයක් තුළ සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට අඩුවන ආකාරයට සභාව කටයුතු කළ යුතු වුවත්, 2015 වර්ෂයේ අවසාන මාස 04 ට අදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝණය කර 2015 ඔක්තෝබර් 26 සිට නොවැම්බර් 27 දක්වා වූ මාසයක් වැනි කාලපරිච්ඡේදය තුළ එක් සමිතියක් ව්‍යාපෘති වටිනාකම රු.3,498,100 ක් වූ ව්‍යාපෘති 07 ක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. 5.4.4(i) ඡේදය ප්‍රකාරව වැඩ කොන්ත්‍රාත් සඳහා ගෙවිය හැකි අත්තිකාරම් මුදල ඇස්තමේන්තුගත මුදලින් සියයට 20 ක උපරිමයකට යටත්ව කළ යුතු වුවද ඉහත සීමාව ඉක්මවා අවස්ථා 2 කදී රු.1,199,846 ක් රු.908,451 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බටහිර රන් අරුණ ව්‍යාපෘතිය යටතේ මූල්‍ය ආධාර මගින් කොන්ත්‍රාත් පදනම මත සංවර්ධනය කර තිබූ වලගෙදර කොස්ගහදෙණිය මාර්ගය 2015 අගෝස්තු 26 දින භෞතික පරීක්ෂා කිරීමේදී එහි සංවර්ධනය කරන ලද මාර්ග කොටසේ දිග (තාර ආලේපනය කළ) වර්ග මීටර් 473.62 ක් බව නිරීක්ෂණය විය. නමුත් තාක්ෂණ නිලධාරීගේ අවසන් ගෙවීම් වාර්තාවේ 2014 දෙසැම්බර් 09 දින ලබාගත් මැණුම් අනුව දිග වර්ග මීටර් 704.50 ක් සඳහා ගෙවා තිබීමෙන් රු.65,339 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2015 යටතේ මණ්ඩාගල කන්ද පාර කොන්ක්‍රීට් කිරීමේ ඇස්තමේන්තුව අනුව දිග මීටර 102 ක් හා පළල මීටර 2.5 ක් වූ අතර 2015 ඔක්තෝබර් 01 දින මෙම ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කර තිබුණි. ව්‍යාපෘතියට අදාලව 2016 පෙබරවාරි 17 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී වර්ග මීටරය බැගින් වූ ප්‍රමාණවලින් ස්ථාන 02 ක සිමෙන්ති බදාම සේදී ගොස් කොන්ක්‍රීට් ගල් මතු වී තිබූ අතර ඉදි කරන ලද මාර්ගයේ දිග මීටර 6.5 ක් හා පළල මීටර 1.40 ක ප්‍රමාණයක කළුගල් තලාවක් පැතිරී තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව එම ප්‍රමාණයට අදාල වර්ග මීටර 9.1 ක කොන්ක්‍රීට් මිශ්‍රණ වියදමක් එනම් රු.14,858 ක් අවසාන ගෙවීම් වාර්තාවලින් අඩු කළ යුතු වුවත් එසේ නොමැතිව සම්පූර්ණ දිග හා පළල සඳහා ගෙවීම් කර තිබුණි.

## 3.4 යටදොලවත්ත ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම

මෙම කර්මාන්තය සඳහා රු.5,580,222 ක ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කරගෙන තිබූ අතර 2015 ඔක්තෝබර් 01 දින කර්මාන්තයේ භෞතික පරීක්ෂායේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ක්‍රීඩාගාරයට දොරවල් සවිකිරීම වෙනුවෙන් රු.1,073,150 ක් හා බිත්තිවල ඉහලින් වූ කවුලු වැසීම සඳහා අමානෝ තහඩු සඳහා රු.7,068,391 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) තවද, ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම කොන්ත්‍රාත් පදනම මතද, සෘජු ශ්‍රම පදනම මතද සිදු කර තිබූ අතර ඒවා වෙන වෙනම දැක්වෙන ආකාරයට ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.

(ඇ) මෙම ගොඩනැගිල්ල සඳහා රෝලර් දොරවල් සහ අමානෝ තහඩු යොදා ආවරණය කිරීම සඳහා විවෘත මිල ගණන් කැඳවා නොතිබුණි.

(ඈ) රෝලර් දොරවල් හා අමානෝ තහඩු යොදා ආවරණය කිරීමේ කොන්ත්‍රාත් සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඉ) අදියර 1 සඳහා රු.1,540,854 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබූ අතර එම ඇස්තමේන්තුව අනුමැතියකින් තොරව රු.1,936,590 කින් වැඩි කර තිබුණි.

(ඊ) කර්මාන්තය අවසානයේ මිණුම් ගෙන වැඩ නිමි වාර්තා සකස් කර නොතිබූ අතර අදාල කාර්යයන් සතුටුදායක ලෙස නිම කර ඇති බව කාර්මික නිලධාරී /වැඩ අධිකාරීගේ තහවුරුවක් නොවීය.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | | අතිරික්ත | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| මාණ්ඩලික | 3 | 3 | | -- | -- |
| ද්විතීය | 53 | 50 | | -- | 3 |
| කණිෂ්ඨ | 118 | 152 | * | 34 | -- |
| අනියම්/තාවකාලික (ආයුර්වේද වෛද්‍ය නිලධාරී) | -- | 1 | | 1 | -- |
| | 174 | 206 | | 35 | 3 |

*2014 දෙසැම්බර් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 අනුව දින 180 සම්පූර්ණවීමෙන් ස්ථිර කරන සේවක සංඛ්‍යාවද තථ්‍ය සේවක සංඛ්‍යාවට ඇතුළත් වේ. උක්ත චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නොපමාව වාර්තා කර කාර්ය මණ්ඩලය යාවත්කාලීන කරගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) අයවැයකරණය

(ඊ) මානව සම්පත් කළමනාකරණය